[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය – 2025

06 | S | I

## 01 ශ්‍රේණිය (06) ගණිතය

පැය දෙකයි

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න පත්‍රයේ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 40ක් හිමි වේ.

විභාග අංකය :.................................................

1. 2873 යන සංඛ්‍යාවේ 8 ඉලක්කම මගින් නිරූපිත අගය කීය ද?


2. අගය සොයන්න. $15 + 20 \times 5$

3. භාග සංඛ්‍යාවක් ලෙස සරල ම ආකාරයෙන් දක්වන්න. 0.75

4. අභයගිරි පිරිවෙනේ 2025 වාර්ෂික අධ්‍යයන චාරිකාව අවසානයේ ඉතිරි වූ මුදල රුපියල් 8200කි. එම මුදල චාරිකාවට සහභාගී වූ සිසුන් 40 දෙනා අතර සමසේ බෙදා දෙන ලදි. එක් අයෙකුට ලැබෙන මුදල කොපමණ ද?

5. සුළු කරන්න. $1.28 + 15.3$

6. රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස ලියා දක්වන්න.



7. ඊසාන පිහිටන්නේ කුමන අනුයාත ප්‍රධාන දිශා දෙක අතර ද?

8. $\frac{2}{5}$ හි හරය 25 වන තුල්‍ය භාගය ලියා දක්වන්න.

www.pirivena.lk



02 වැනි පිටුව බලන්න.

9. කුඩා ම පොදු ගුණාකාරය සොයන්න. $4, 6, 10$

10. සුළු කරන්න. $5kg\ 254g - 3kg\ 78g$

11. සුළු කරන්න. $6m\ 56cm + 12m\ 37cm$

12. 8 හි දෙවන හා සිව්වන ගුණාකාර 2 ලියන්න.

13. දී ඇති ඒකක අතුරෙන් දිග මැනීමට භාවිත කරන ඒකක තෝරා ලියන්න. $ml, kg\ , cm, g,\ mm, l$

14. දී ඇති භාග සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න. $\frac{2}{3}, \frac{2}{15}, \frac{2}{11}, \frac{2}{5}$

15. මීටර් 5 සෙන්ටිමීටර 7 , සෙන්ටිමීටරවලින් ලියන්න.

16. රුපියල් 126 බැගින් පොත් 7ක් මිලට ගෙන රුපියල් 1000 නෝට්ටුවක් වෙළෙන්දාට දුන් විට ලබාදුන් ඉතිරි මුදල කීය ද?

17. 24 හි ප්‍රථමක සාධක ගුණිතය ලියා දක්වන්න.

18. සුළු කරන්න. දින 5 පැය 12 + දින 7 පැය 20


www.pitiyena.lk
03 වැනි පිටුව බලන්න.

19. දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න. $\frac{7}{20}$

20. වෙළෙන්දෙක් තේ කුඩු $5kg$ක් තේ නිෂ්පාදන කර්මාන්ත ශාලාවකින් මිල දී ගෙන ආවේ ය. එම තේ කුඩු ප්‍රමාණය පාරිභෝගිකයින්ට විකිණීම සඳහා $250g$ හි පැකට්වලට අසුරන ලදි. ඇසුරුම් කළ පැකට් ගණන කීය ද?

ii කොටස

- ප්‍රශ්න 6කට පමණක් පිළිතුරු ලියන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60.
- පිළිතුරු ලිවීමට අමතර කඩදාසි භාවිත කරන්න.

1) i. විසිඅටමිලියන දෙසිය විස්ස යන සංඛ්‍යාව කලාපවලට වෙන් කර ඉලක්කමෙන් ලියන්න.

ii. 456703008 යන සංඛ්‍යාව,

a. සම්මත ආකාරයෙන් ලියන්න.

b. වචනයෙන් ලියන්න.

iii. සංඛ්‍යා සම්මත ආකාරයට (කලාපවලට වෙන් කර) ලිවීම මගින් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

iv. කෝටියක් යනු මිලියන 10කි. බිලියනයක ඇති කෝටි ගණන සොයන්න.

2) i. කසුන් තම වත්තෙහි පිහිටි පොල් ගස්වලින් ගසකින් ගෙඩි 15 බැගින් ගස් 8 කින් ද ගසකින් ගෙඩි 20 බැගින් ගස් 5 කින් ද ගසකින් ගෙඩි 25 බැගින් ගස් 3 කින් ද පොල් කඩා ගන්නා ලදි.

a. ඔහු විසින් කඩා ගන්නා ලද මුළු පොල් ගෙඩි සංඛ්‍යාව කොපමණ ද?

b. ඔහු ඉන් ගෙඩි 20ක් නිවසෙහි පරිභෝජනයට තබා ඉතිරි ගෙඩි සියල්ල, ගෙඩියක් රුපියල් 200 බැගින් විකුණුවේ නම් ඉන් ඔහුට ලැබුණු මුදල ගණනය කරන්න.

ii. පෙට්ටියක විස්කෝතු 705ක් අඩංගු වේ. එක් අයෙකුට විස්කෝතු 15 බැගින් එම විස්කෝතු ප්‍රමාණය කී දෙනෙකුට දිය හැකි ද

3) i. තුල්‍ය භාග ඇසුරින් හිස් තැන්වලට ගැළපෙන සංඛ්‍යා යොදන්න. $\frac{3}{7} = \frac{.....}{21} = \frac{15}{.....}$

ii. විශාල භාගය තෝරා ලියන්න. $\frac{3}{8}$ , $\frac{3}{10}$ , $\frac{1}{4}$

iii. සුළු කරන්න. $\frac{3}{13} + \frac{9}{13} - \frac{5}{13}$

iv. සුළු කර පිළිතුර සරල ම භාගයක් ලෙස දක්වන්න. $\frac{19}{24} - \frac{5}{8} + \frac{1}{6}$

www.pirivena.lk



04 වැනි පිටුව බලන්න.

4) i. 5, 1, 6, 10, 12, 7, 11, 25, 9, 18, 19, 13, 20, 49 යන සමූහය තුළ ඇති සංඛ්‍යා, ප්‍රථමක සංඛ්‍යා, ඉරට්ට සංඛ්‍යා, සමචතුරස්‍ර සංඛ්‍යා යන පොදු ලක්ෂණ ඇතුළත් වනසේ කාණ්ඩ කර දක්වන්න.

ii. ඉරට්ට සංඛ්‍යාවක් වන ප්‍රථමක සංඛ්‍යාව කුමක් ද?

iii. 36හි සාධකවලින් 1ත් 15ත් අතර ඇති සාධක සියල්ල ලියන්න.

iv. 24 හා 36හි මහා පොදු සාධකය සොයන්න.

5) i. සෘජුකෝණයක් ඇඳ එහි සෘජුකෝණය නිරූපණය සඳහා යොදා ගන්නා සලකුණ යොදන්න.


ii. සෘජුකෝණය හැර වෙනත් කෝණ වර්ග තුනක් නම් කර එක එකක් සඳහා රූපය බැගින් අඳින්න.

iii. සෘජුකෝණ දෙකක් සමාන වන කෝණ වර්ගය කුමක් ද?

iv. මිනිසුන් විසින් සාදන ලද (නිර්මිත) වස්තුවල බහුලව දක්නට ලැබෙන කෝණ වර්ගය සඳහන් කරන්න.

6) i. අනුදිශා 4 ලියා දක්වන්න.

ii. දී ඇති රූපයේ තොරතුරු අසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




a. නිවසට උතුරු දෙසින් පෙන්වා ඇති කොටුව තුළ “පොල් ගස” යන වචනය ලියන්න.

b. කොස් ගසට බටහිර දෙසින් නිවස පිහිටන පරිදි දී ඇති කොටුව තුළ “කොස් ගස” යන වචනය ලියන්න.

c. අඹගසට දකුණින් ඇති කොටුවේ “බැංකුව” යන වචනය ලියන්න.

d. අඹගසට ගිනිකොණ දෙසින් පිහිටන කොටුව තුළ “වෙළෙඳසල” යන වචනය ලියන්න.

e. ඉතිරි කොටුව තුළ “පාසල” ලෙස ලියා නිවසට අනුව පාසල පිහිටා ඇති දිශාව ලියන්න.

f. පාසලට වයඹ දෙසින් පිහිටා ඇත්තේ මොනවා ද?


g. දෙල්ගසට නැගෙහිරින් හා නිවසට ඊසාන දෙසින් පිහිටා ඇත්තේ කුමක් ද?

7) i. එකසිය දහ අටයි දශම බින්දුවයි තුන ඉලක්කමෙන් ලියන්න.

ii. ගණක රාමුවේ නිරූපණය කර ඇති සංඛ්‍යාව,


a. ඉලක්කමෙන් ලියන්න.

b. අකුරින් ලියන්න.




iii. $-5, 1, 6, -2$ යන සංඛ්‍යා,

a. සංඛ්‍යා රේඛාව මත නිරූපනය කරන්න.




b. අවරෝහණ පිළිවෙළට ලියන්න.

iv. 96හි 7 සාධකයක් ද? පිළිතුරට හේතුව පැහැදිලි කරන්න.

*****

www.pirivena.lk